# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2271/8 - 2022 මාර්තු මස 14 වැනි සඳුදා - 2022.03.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙලින් 44 (1), 45 (1) සහ 47 (1) (අ) (ආ) ව්‍යවස්ථාවන්ට අනුකූලව, මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2020 අගෝස්තු මස 09 දිනැති අංක : 2187/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය, වරින් වර සංශෝධනය කරන ලදුව, 2022 මාර්තු මස 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගෝඨාභය රාජපක්ෂ,
ජනාධිපති.

2022 මාර්තු මස 14 වන දින
ජනාධිපති කාර්යාලය
කොළඹ - 01.

1A - G 36365 — 370 (2022/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(1) එම නිවේදනයෙහි අංක "29.0 කර්මාන්ත අමාත්‍ය" ශීර්ෂය යටතේ වන "03.සුවිශේෂී ප්‍රමුඛතා සහ 04. අදාළ ආයතනික හා නෛතික රාමුව" පහත පරිදි;

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. සියළුම කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු අදාළ ආයතන සමග ඒකාබද්ධව නිරාකරණය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
2. ආනයන අපනයන ක්‍රියාවලිය බාධාවකින් තොරව සහ අවම කාලයක් වැයවන පරිදි කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා "තනි ඒකාබද්ධ යාන්ත්‍රණයක්" ස්ථාපනය කිරීම
3. අපනයනය ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සියළු පළාත් ආවරණය වන පරිදි ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
4. පවත්නා කර්මාන්තයන් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමටත්, ආයෝජන අවස්ථා පුළුල් කරමින් නව කර්මාන්ත ක්ෂේත්‍රයන් සඳහා ප්‍රවේශයන් ඇති කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් සැකසීම හා ක්‍රියාත්මක කිරීම
5. බිඳවැටී ඇති ව්‍යාපාර හා කර්මාන්තයන් යළි නගා සිටුවීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම
6. දේශීය ව්‍යවසායකයින් හා ව්‍යාපාරිකයන් ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා වැඩපිළිවෙලක් සැකසීම
7. දැනටමත් ආයෝජන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ ඒකාබද්ධව එරාවූර් ප්‍රදේශය තුළ ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ඇඟලුම් කර්මාන්ත පුරය ඇරඹීම සඳහා අවශ්‍ය සියළුම යටිතල පහසුකම් ලබා දීම

**04. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය<br>2. ලංකා ලේලන්ඩ් ලිමිටඩ්<br>3. ලංකා අශෝක් ලේලන්ඩ් ලිමිටඩ්<br>4. සීමාසහිත ජාතික කඩදාසි සංස්ථාව<br>5. සීමාසහිත කහගොල්ල ඉංජිනේරු සේවා සමාගම (KESCO)<br>6. මාන්තායි සෝල්ට් ලිමිටඩ්<br>7. අලිමංකඩ ලුණු ලේවාය<br>8. රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය<br>9. සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම<br>10. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව<br>11. පරන්තන් කෙමිකල්ස් ලිමිටඩ්<br>12. කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්<br>13. ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය)<br>14. සිමාසහිත බී.සී.සී.සමාගම<br>15. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය | • කර්මාන්ත සංවර්ධන පනත (1969 අංක 36)<br>• කර්මාන්ත ප්‍රවර්ධන පනත (1990 අංක 46)<br>• ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනත (2006 අංක 17)<br>• ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත (1980 අංක 41) |

(2) එම නිවේදනයෙහි අංක "13.0 පරිසර අමාත්‍ය" ශීර්ෂය යටතේ වන "03.සුවිශේෂී ප්‍රමුඛතා සහ 04. අදාළ ආයතනික හා නෛතික රාමුව" පහත පරිදි;

**03. සුවිශේෂී ප්‍රමුඛතා**

1. තිරසර පරිසර සංකල්පය, පාසල් අධ්‍යාපනයේ සිට ප්‍රජාව තුළ ආකල්පමය වශයෙන් ප්‍රතිෂ්ඨාපනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම
2. පරිසර ආශ්‍රිත බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය සමාලෝචනයට ලක් කොට පරිසර හිතකාමී මෙන්ම ජනතා හිතකාමී ලෙස එම ක්‍රියාවලිය මෙහෙයවීම සරල කිරීම
3. පරිසර හිතකාමී නිෂ්පාදන, බෙදාහැරීම්, ප්‍රවාහන සේවා, යටිතල පහසුකම්, නාගරික සංවර්ධන සහ ආයෝජන හා ආර්ථික කලාප කටයුතු මෙහෙයවීමේදී ව්‍යාපාරික හා සංවර්ධන අවශ්‍යතා තිරසර සංවර්ධන ඉලක්ක සමග තුලනය කිරීම
4. පරිසර සංරක්ෂණය සඳහා නවීන දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වාදීම
5. දැනට භූගතව සහ සාගර අභ්‍යන්තරයේ ඇතැයි සැලකෙන ඛනිජ සම්පත් නූතන අධිතාක්ෂණ භාවිත කර ගවේෂණය කර රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට යොදා ගැනීම

**04. අදාළ ආයතනික හා නෛතික රාමුව**

| *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. මධ්‍යම පරිසර අධිකාරිය<br>2. භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය<br>3. සීමාසහිත GSMB තාක්ෂණික සේවා පුද්ගලික සමාගම<br>4. ශ්‍රී ලංකා ක්ලයිමේට් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්<br>5. ලංකා ඛනිජ වැලි සමාගම | • පතල් හා ඛනිජ පනත (1992 අංක 33)<br>• ජාතික පාරිසරික පනත (1980 අංක 47) |

EOG 03 - 0878

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.